# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

අංක 1719/22 - 2011 අගෝස්තු 18 වැනි බ්‍රහස්පතින්දා - 2011.08.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ශ්‍රී ලංකා මහ බැංකුවේ නිවේදන

**විනිමය පාලන පනත යටතේ දැන්වීම (ලංකා ව්‍යවස්ථාදායක ප්‍රඥප්ති සංග්‍රහයේ 423 වැනි අධිකාරිය)**

1. **විනිමය පාලන පනතේ 7, 10, 11 සහ 15 වගන්ති ප්‍රකාර අවසරය**

(අ) සංශෝධිත 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් මත ක්‍රියාත්මක වන ඒකක භාරයක ඒකක පහත දැක්වෙන දෙවැනි ඡේදයේ දක්වා ඇති කොන්දේසිවලට යටත්ව විදේශීය ආයතනික ආයෝජකයන්ට, ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාපිත සමාගම්වලට සහ අනේවාසික පුද්ගලයන්ට (අනේවාසික ශ්‍රී ලාංකිකයන්ද ඇතුළත්ව) නිකුත් කිරීමට සහ පැවරීමට විනිමය පාලන පනතේ (ලංකා නීති ප්‍රඥප්තිවල 423 අධිකාරිය) 10, 11 සහ 15 වගන්තිවල කාර්යයන් සඳහා මෙයින් අවසරය ප්‍රදානය කරනු ලැබේ.

(ආ) ඉහත (අ) උපඡේදය යටතේ අවසර දෙන ලද ගනුදෙනුවක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවෙන් පිටත වාසිකයෙකුට කරන ගෙවීමක් හෝ බැර කිරීමක් සඳහා විනිමය පාලන පනතේ 7 වගන්තිය යටතේ මෙයින් අවසරය ප්‍රදානය කරන අතර, එවැනි ගෙවීම් 2(ඇ) ඡේදය ප්‍රකාර සිදු කළ යුතුය.

2. **කොන්දේසි :**

(අ) මේ යටතේ අවසර දෙනු ලැබූ ගනුදෙනුවක පාර්ශ්වකරුවකු වන්නා වූ ශ්‍රී ලංකාවෙන් පිටත වාසය කරන තැනැත්තකු විසින් එම තැනැත්තා ශ්‍රී ලංකාවෙන් පිටත වාසිකයෙකු වන බවට ඒකක මිලදී ගැනීම සඳහා වන අයැදුම් පත්‍රයෙහි ප්‍රකාශයක් කළ යුතුය ;

(ආ) මේ යටතේ අවසර දෙනු ලැබූ කිසියම් හෝ ගනුදෙනුවක, ඒකක මිලදී ගැනීම සඳහා කරනු ලබන ගෙවීම විනිමය පාලක විසින් දෙන ලද විධානවලට අනුකූලව ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී වාණිජ බැංකුවක විවෘත කරන ලද සුරැකුම්පත් ආයෝජන ගිණුමෙන් හෝ ඒ ගිණුමට පමණක් කරනු ලැබිය යුතුය ;

(ඇ) මේ යටතේ අවසර දී ඇති කිසියම් ගනුදෙනුවක් සම්බන්ධයෙන් වන ඒකක නිදහස් කිරීමෙන් හෝ අලෙවි කිරීමෙන් ලැබෙන මුදල්, මුදල් හෝ කොමිස් වැනි ගෙවීම් ඒ සඳහා බලය පැවරෙන කළමනාකරණ සමාගමක්, භාරකරුවෙකු, වාණිජ බැංකුවක්, බලපත්‍ර ලත් තැරැව්කරුවෙකු හෝ වෙනත් පුද්ගලයෙකු ඉහත (ආ) උප ඡේදයෙහි සඳහන් සුරැකුම්පත් ආයෝජන ගිණුමකින් හෝ එම ගිණුමකට පමණක් කළ යුතුය ;

1A - G 14953— 350 (2011/08)

(ඇ) කිසියම් ඒකක භාරයක, ඒකක නිකුත් කිරීම, පැවැරුම් හෝ ඒකක හිමියන් පිළිබඳව නාම ලේඛනයක් පවත්වා ගෙන යාමට බලයලත් කළමනාකරණ සමාගමක් හෝ වෙනත් පුද්ගලයෙකු විදේශ ආයතනික ආයෝජකයෙකුගේ, ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාපිත සමාගමක හෝ අනේවාසික පුද්ගලයෙකුගේ නම (අනේවාසික ශ්‍රී ලාංකිකයන් ද ඇතුළුව) හෝ ඔවුන්ගේ නාමිකයෙකුගේ නම එම ඒකක භාරයේ ඒකක හිමියකු වශයෙන් ලියාපදිංචි කිරීමේදී මෙම දැන්වීමට අදාල එවැනි නිකුත් කිරීම් හෝ පැවරුම් සම්බන්ධ කොන්දේසිවලට අනුකූලව පිළිගත හැකි සාක්ෂි ඉදිරිපත් කිරීමට අපොහොසත් කිසිවකුගේ නම් ලියාපදිංචි නොකල යුතුය.

3. **අර්ථ නිරූපනය :**

(අ) "ඒකක භාරයන්", "කළමනාකරණ සමාගම්", "භාරකරු" සහ "ඒකක හිමියන් " සම්බන්ධයෙන් 1991 අංක 26 දරන පනතින් සංශෝධනය කරන ලද 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනතේ දී ඇති අර්ථයන්ම ඇත්තේ ය.

(ආ) " ශ්‍රී ලංකාවේ නේවාසික පුද්ගලයෙකු " සහ "ශ්‍රී ලංකාවෙන් පිටත පදිංචිව සිටින පුද්ගලයෙකු " සම්බන්ධයෙන් විනිමය පාලන පනත යටතේ 1992.04.21 වැනි දින නිකුත් කරන ලද රජයේ ගැසට් අංක 15007 දී ඇති අර්ථයන්ම ඇත්තේ ය.

පී. එච්. ඕ. චන්ද්‍රවංශ,
**විනිමය පාලක.**

2011 අගෝස්තු මස 18 වැනි දින,
කොළඹ දී ය.

09-100

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.